තනතුරු - ඇබෑර්තු

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සමාජ සේවා දෙපාර්තමේන්තුව

වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල වෘත්තීය උපදේශක තනතුරු පුරප්පාඩු 15 බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල ලිපිනයට 2026.11.30 **දිනට පෙර ලැබෙන සේ තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ** "වෘත්තීය උපදේශක තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සකස් කර තිබිය යුතු ය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

1. **තනතුරු පුරප්පාඩු ආයතන - 15**

අනු. අංකය	*වෘත්තීය උපදේශක තනතුර*	*වෘත්තීය පුහුණු ආයතනය*	*තනතුරු සංඛ්‍යාව*
01	ජලනල කාර්මික ශිල්පී	අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය	03
		කැටවල වෘත්තීය පුහුණු ආයතනය	
		සීදුව වෘත්තීය පුහුණු ආයතනය	
02	විසිතුරු ආභරණ ශිල්පී	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	03
		මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය	
		කලවාන වෘත්තීය පුහුණු ආයතනය	
03	කර්මාන්තශාලා මහන යන්ත්‍ර ක්‍රියාකරු	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	02
		අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය	
04	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය	02
		කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය	
05	වෙළඳ සහායක	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	01
06	ටේලර්	කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනය	01
07	කඩදාසි ප්‍රතිවක්‍රීකරණ කාර්මික ශිල්පී	මඩකලපුව වෘත්තීය පුහුණු ආයතනය	01
08	රූපලාවන්‍ය ශිල්පී	වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය	01
09	බේකරි ශිල්පී (පේස්ට්‍රි සහ බේකරි)	තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය	01
මුළු පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව			15

1.1 **විවෘත බඳවා ගැනීම**

1.1.1 **වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතු යි.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

1.1.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) වෘත්තීය උපදේශක (ආහාර තාක්ෂණය/ බේකරි හා පේස්ට්‍රි නිෂ්පාදනය) තනතුරු සඳහා සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසී භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම;

(ආ) වෘත්තීය උපදේශක (ආහාර තාක්ෂණය/ බේකරි හා පේස්ට්‍රි) තනතුරු හැර අනෙකුත් තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්.

(i) සිංහල/ දෙමළ/ භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතියික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

1.1.3 වෘත්තීය සුදුසුකම් :-

අදාළ වෘත්තීය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා තිබීම;

හෝ

වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා තිබීම.
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

1.1.5. **කායික සුදුසුකම් :-**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

1.1.6. වෙනත් :-

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

1.1.7. **බඳවා ගැනීමේ ක්‍රමය :-**

ලිඛිත හා වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

1.1.7.1 ලිඛිත පරීක්ෂණය :-

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
බුද්ධි පරීක්ෂණය	කාලය පැය 01	100	40
අවබෝධය	කාලය පැය 01	100	40

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

1.1.7.2 වෘත්තිය පරීක්ෂණය :- වෘත්තීය උපදේශක ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම

විෂයයන්	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
01. පාඩමට පෙර පන්තිය සූදානම් කර ගැනීම	25	40%
02. පාඩමට පිවිසීම	25	
03. උපදේශකවරයාගේ විෂය පිළිබඳ දැනුම	25	
04. අභ්‍යාසලාභීන්ගේ අවධානය දිනාගැනීමට යොදා ගන්නා ශිල්පීය ක්‍රමයන්හි සක්‍රීයභාවය	25	
එකතුව	100%	

1.1.8 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:-

තනතුරට නියමිත සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සහතිකපත් පරීක්ෂාව (ලකුණු ලබාදෙනු නොලැබේ.)

1.1.9. වැටුප් පරිමාණය :-

රා.ප.ව. 10/2025 අනුව MT-01 -2025
වැටුප් පරිමාණය රු.50,090-10x540-11x630-10x1,010-10x1,190-84,420/- වේ.
(මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

1.1.10 සටහන :

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එම අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් අතුරින් ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ දෙකෙහි මුලු ලකුණු එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ .

1.1.11. සේවා කොන්දේසි :-

මෙම තනතුර ස්ථීරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතු ය. රා.ප.ව. 18/2020 හා ඊට ආනුශංගික වක්‍රලේඛ අනුව වසර තුනක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

1.1.12. සටහන :

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක් අනිවාර්යෙන්ම සේවය කළ යුතු ය.

දර්ශනී කරුණාරත්න,
සමාජ සේවා අධ්‍යක්ෂ.

2026 ඔක්තෝබර් මස 26 දින,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහළ,
II වන අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED